**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, වාණිජ අත්තිකාරම් ගිණුම් හා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.2.2 වගුවේ ඇතුළත් ආදායම් සංකේතයට අදාළ ආදායම් ගිණුම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරිගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 05 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශ හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදි අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරින් විසින් විධිවිධානයනට අනුගත නොවීම් | නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරිමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දරන බවත්, | 1. ක්‍රියාකාරී සැලැස්මේ අඩුපාඩු | 2.1.1(අ) |
| | | 2. කළාපීය ගොවි ගැටළු හඳුනාගැනීම සඳහා වූ පර්යේෂණ සැලැස්මේ අඩුපාඩු | 2.1.1.(ආ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලවද සම්පූර්ණයෙන්මද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරිමටද, රජය වෙනුවෙන් වගකිම්වලට බැදීම් | 1. සීමාව ඉක්මවා බැදීම් හා බැරකම්වලට එළඹීම | 2.5 |
| | | 2. වාණිජ අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කිරිම | 2.12(අ) |

| | | | |
|---|---|---|---|
| | සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම අධීක්ෂණය හා පරීක්ෂා කිරිමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් කරම් විධිවිධාන සලසන බවත්, | 3. ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යන අත්තිකාරම් ගිණුම්වල කාරක පාඩු කපාහැරීමට කටයුතු නොකිරීම | 2.13(අ) |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදි පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදි ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බවත්, | 1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු නොකිරිම | 2.15 |
| | | 2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම | 2.16 |
| | | 3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම | 2.17 |
| | | 4. නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් පරිදි පවත්වා නොතිබීම | 2.18 |
| 128(1)(ඇ) | ලැබීම්,ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බවත්, | කළමනාකරණ අඩුපාඩු | 2.6 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනිම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරිම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවත්, | 1. රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරිම | 2.4.(අ) |
| | | 2. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම | 2.4.(ආ) |
| | | 3. පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය | 2.4.(ඇ) |

| | | | |
|---|---|---|---|
| | | 4. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | 2.4.(ඇ) |
| | | 5. අවිධිමත් ලෙස භාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.4.(ඉ) |
| | | 6. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම | 2.4.(ඊ) |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධි විධාන යොදන බව සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | 1. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.11 |
| | | 2. වාණිජ අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.12(ආ) |
| | | 3. ගනුදෙනු බේරා වසා දැමීමේ අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.13(ආ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බවත්, | 1. ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු නොකිරීම | 2.1.2 |
| | | 2. අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම | 2.1.3 |
| | | 3. විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| | | 4. අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය සඳහා ශ්‍රවනාගාරය ඉදිකිරීමේ අඩුපාඩු | 2.3.1 |

| | | | |
|---|---|---|---|
| | | 5. කුණ්ඩසාලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීමේ අඩුපාඩු | 2.3.2 |
| 128(1)(ක) | ගණන්දීමේ නිලධාරී වශයෙන් තමා වගකීමට බැඳී සිටින වියදම් ශීර්ෂයක එක් එක් වැඩසටහන වෙනුවෙන් මුදල් වර්ෂය අවසානයේදී විසර්ජන ගිණුමක් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන බවත්, | අධි ප්‍රතිපාදන සලසා තිබීම | 2..9 |
| 128(2)(ඇ) | එකතු කර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳී ඇති රාජ්‍ය ආදායමෙන් යම් කොටසක් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මගින් එකතු කරනු ලැබේ නම් ඒ දෙපාර්තමේන්තු වලින් හා කාර්යාලවලින් වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් කරුණු රාජ්‍ය ආදායම් ඇස්තමේන්තුවලටද පිළිවෙලින් පූර්වෝක්ත (අ), (ආ) සහ (ඇ) ඡේද ප්‍රකාරව තමා විසින් පිළියෙල කරන රාජ්‍ය ආදායම් ගිණුම්වල හා වාර්තාවල ද අන්තර්ගත කරන බවත්, | පනත්වල සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ආදායම් ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු නොකිරිම | 2.10 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 කාර්යසාධනය

### 2.1.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාල රාමුව හා ප්‍රතිඵල ඇතුළත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කළ දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර නොතිබුණි.

(iii) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අවස්ථා කිහිපයකදී සංශෝධනය කර තිබුණද, ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

(iv) වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පුහුණු වැඩසටහන් පිළිබඳව සැලකිල්ලට ගැනීමකින් තොරව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ තාක්ෂණික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර තිබුණි.

**(ආ) කළාපීය ගොවි ගැටළු හඳුනා ගැනීම සඳහා වූ පර්යේෂණ සැලැස්ම**

**--------------------------------------------------------------------**

ඌව සහ සබරගමුව පළාත්වල ගොවි ප්‍රජාවගේ ගැටළු හඳුනාගෙන ඒවායින් ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර කෙරෙහි පර්යේෂකයින්ගේ විශේෂ අවධානය යොමු කරවීම බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයෙන් ඉටුවිය යුතු ප්‍රධාන කාර්යභාරයක් වී තිබුණි. කළාපයේ ගොවි ගැටළු අධ්‍යයන කර ප්‍රමුඛතාවය දියයුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා වූ පර්යේෂණ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. ඒ වෙනුවට එක් එක් පර්යේෂකයාගේ අභිමතය පරිදි ක්ෂේත්‍ර පදනම් කරගෙන පර්යේෂණ වැඩසටහන් සකස් කර තිබුණි.

**2.1.2 ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් ඉටු නොකිරීම**

**--------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයට අදාළව බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් ඉටුකරන ලද තාක්ෂණික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වාර්ෂික ඉලක්ක සමඟ සැසඳීමේදී, ක්‍රියාකාරකම් 12 කින් ක්‍රියාකාරකම් 07 ක ප්‍රගතිය සියයට 30 ක සිට සියයට 53 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවතුණි.

(ආ) 2015 වර්ෂයේ ආරම්භ කරන ලද ගුණාත්මක සහ සෞඛ්‍ය ආරක්ෂිත කෘෂි නිෂ්පාදන සඳහා යහපත් කෘෂි පිළිවෙත් වර්ධන ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් 13 කින් ක්‍රියාකාරකම් 07 ක් 2017 අගෝස්තු මාසය වන විටද, ආරම්භ කර නොතිබුණි.

**2.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන වශයෙන් වගා කරන එළවළු වර්ග 05 කට අදාළ දේශීය එළවළු බීජ අවශ්‍යතාවය මුළුමනින්ම ආනයනය මතම රඳා පවතින අතර, තවත් බහුලව වගාකරන එළවළු වර්ග 12 ක දේශිය බීජ අවශ්‍යතාවයෙන් දෙපාර්තමේන්තුව සපයන ප්‍රමාණය සියයට 6.03 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) කුණ්ඩසාලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට අයත් හෙක්ටයාර 1.5 ක් පමණ වූ භූමියේ 2016 හා 2017 වර්ෂවලදී එකතුව රු.912,085 ක වියදමින් අන්නාසි හා කෙසෙල් වගාවක් ආරම්භ කර තිබුණි. විගණිත දිනය වූ 2017 අගෝස්තු 11 දින වන විට එහි සාර්ථක තත්ත්වයේ වූ අන්නාසි පැළ කිසිවක් නොතිබුණු අතර, කෙසෙල් පැළ 350 ක් පමණක් පැවතුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2017 ජූලි 31 දින දක්වා රජයේ ගොවිපළවල එළවළු ප්‍රභේද 6 කට අදාළව දෙමුහුම් බීජ නිෂ්පාදනය සිදුකර තිබුණි. 2017 වර්ෂයේදී වම්බටු, බණ්ඩක්කා හා මාළු මිරිස් ප්‍රභේදවල බීජ නිෂ්පාදනය මුළුමනින්ම නතරවී තිබුණි. අනෙකුත් එළවළු ප්‍රභේද 3 හි බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ.3.4 ක සිට කි.ග්‍රෑ. 78.1 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පැවැතුණි. ඒ අනුව උසස් ගුණත්වයෙන් යුතු බීජ නිෂ්පාදනය කෙරෙහි අඩු අවධානයක් යොමුවීම දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ඈ) 2017 ජූලි 31 දින වන විට වෙනත් ක්ෂේත්‍ර භෝගවල වාර්ෂික ජාතික බීජ අවශ්‍යතාවයේ ඉලක්ක සපුරා ගැනීම (කුරක්කන් භෝගය හැර) සියයට 2.9 ක සිට සියයට 20.63 ක් දක්වා පරාසයක ප්‍රමාණයක පහළ මට්ටමක පැවතුණි.

(ඉ) දේශීය අර්තාපල් බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර ඒ සඳහා පසුගිය වර්ෂ 04 ක කාලය තුළ රු.මිලියන 195.5 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 169.7 ක් උපයෝජනය කර තිබුණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවල් 05 ක් අර්තාපල් බීජ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වී තිබුණි. එම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු අතර බීජ නිෂ්පාදනය 2014 වර්ෂයට සාපේක්ෂව 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් සියයට 1.4 ක් හා සියයට 10 ක් වශයෙන් වැඩි වී තිබුණි.

(ඊ) අලුත්තරම ගොවිපොළහි ප්‍රමාණවත් තරම් TOM-EJC වර්ගයේ අඹ මව් ශාක නොතිබුණු බැවින් අඹ පැළ බද්ධ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍යය මහවැලි ගොවිපළට අයත් අඹ වගාවෙන් සපයා ගෙන තිබුණි. මහවැලි ගොවිපළට අයත් වගාවන් බීජ සහතික කිරීමේ සේවය මගින් මව් ශාක ලෙස තෝරා ගැනීමක් සිදු කර නොතිබුණි. එබැවින් නිෂ්පාදනය කරන ලද බද්ධ පැළ සඳහා දෙපාර්තමේන්තු පැළ සහතික කිරීමක් සිදු නොකර ඒ වෙනුවට දෙපාර්තමේන්තු ලාංඡන සහිත ගොවිපළ පැළ නිකුත් කර තිබුණි.

(උ) උද්‍යාන භෝග පිළිබඳව තිරසර සහ ඵලදායී තාක්ෂණය සම්බන්ධව පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට දායකත්වය ලබාදීමේ අරමුණෙන් පස්යාල උද්‍යාන විද්‍යා පර්යේෂණ ගොවිපළ පිහිටුවා තිබුණි. පසුගිය වර්ෂ 07 ක කාලපරිච්ඡේදය තුළ එම ගොවිපෙළහි රඹුටන් වගාව පිළිබඳව පර්යේෂණයක් පමණක් සිදුකර තිබුණි.

(ඌ) 2012 වර්ෂයේදී බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ G-0 බීජ අර්තාපල් නිෂ්පාදනය වැඩිකිරීමේ අරමුණෙන් රහංගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට රු.මිලියන 4.5 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම මධ්‍යස්ථානය මගින් අර්තාපල් බීජ නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි. 2014 වර්ෂයේ පැවති අයහපත් කාලගුණය හේතුවෙන් එම අර්තාපල් ගෘහවලට සිදුවී තිබුණු හානි යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(එ) පසුගිය වර්ෂ 10 ක කාලය තුළ බණ්ඩාරවෙල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය මගින් බීජ අභිජනනය සිදු කිරීමේ කාර්යය වෙනුවෙන් දායකවීම ඉතා පහළ මට්ටමක පැවැතුණි. භෝග ප්‍රභේදයන් 3 ක් පමණක් නිදහස් කර තිබුණු අතර එම ප්‍රභේදයන්ගේ ව්‍යාප්තිය ද ඉතා පහළ මට්ටමක පැවතුණි. එසේම ව්‍යාප්තිය අඩුවීමට හේතු සොයාබලා එම පර්යේෂණයන් සංවර්ධනය කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකාව විසින් ආනයනය කරනු ලබන එළවළු බීජ විශාල ප්‍රමාණයක් ගොවියාගේ අපේක්ෂාවන්ට ගැළපෙන පරිදි කාලානුරූපීව වෙනස් කරන ප්‍රභේදයන් වී තිබුණි. මේ නිසා දේශීයව නිෂ්පාදනය කර බෙදාහරින එළවළු ප්‍රභේද ගොවියාගේ අපේක්ෂා මට්ටමට ළඟා වී

නොතිබුණි. මේ නිසා ඉදිරි කාලයේදී ආනයනික බීජ ප්‍රභේද මත යැපීමට සිදු වීමේ අවදානම කෙරෙහි දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඔ) 1990 දශකයේදී බඩඉරිඟු දෙමුහුම්කරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා ප්‍රවේශ වී තිබුණු අතර, 2004 වර්ෂයේදී ඉන් එක් ප්‍රභේදයක් හඳුන්වාදී තිබුණි. නමුත් එම ප්‍රභේදයෙන් 2016 වර්ෂයේදී කි.ග්‍රෑ.169 ක් ක්ෂේත්‍රයට මුදාහැර තිබුණු අතර, එය දේශීය බීජ අවශ්‍යතාවයෙන් සියයට 0.01 ක් වැනි පහළ අගයක් ගෙන තිබුණි.

(ඕ) ලොකු ලූනු වගාව සඳහා නව බීජ වර්ග හඳුන්වාදීම, ඒවාට වැළඳෙන රෝග හා පළිබෝධ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර දේශීයව ලූණු නිෂ්පාදනය ඉහළ නැංවීමේ මූලිකම වගකීම මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට පැවරී තිබුණු කාර්යභාරයක් වී තිබුණි. 1997, 2009 හා 2014 යන වර්ෂවලදී ලොකු ලූනු ප්‍රභේද 03 ක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී තිබුණද පසුගිය වර්ෂ 03 හි ඒවායේ ව්‍යාප්තිය දේශීය බීජ අවශ්‍යතාවයෙන් සියයට 0.01 ක සිට සියයට 33 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවතුණි.

(ක) ශ්‍රී ලංකාවේ පළිබෝධනාශක ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීමේ අධිකාරී බලය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත පැවරී තිබුණි. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද පළිබෝධනාශක වර්ග 200 කින් වර්ග 186 ක් හෙවත් සියයට 93 ක පළිබෝධක නාශක පිළිබඳව රසායනාගාර තත්ත්ව පරීක්ෂාවන් සිදු කර නොතිබුණි.

(ග) 1994 අංක 6 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දිවයින පුරා පිහිටි සියලුම පළිබෝධනාශක අලෙවිසැල් විසින් වලංගු බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වී තිබුණි. එම පනතේ 21(4)(අ) වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු බලපත්‍රය මාස 12 ක කාලසීමාවක් වලංගුව ක්‍රියාත්මකව පැවැතුණි. 2016 වර්ෂයේදී ලියාපදිංචි පළිබෝධනාශක අලෙවිසැල් 1,461 ක් පැවැති අතර ඉන් වලංගු කාලය ඉකුත් වී තිබුණු අලෙවිසැල් 440 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් බලපත්‍ර අළුත් කර ගෙන නොතිබුණි.

(ච) නව දෙමුහුම් හා විවෘත පරාගනය මගින් බීජ නිෂ්පාදනය හා මූලික බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර භෝග පර්යේෂණ ආයතනයට 2015 හා 2016 වර්ෂවල ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 1.43 ක් හා රු.මිලියන 4.91 ක් උපයෝජනය කර තිබුණි. මිරිස්, බඩඉරිඟු හා ලූනු භෝගවලට අදාළව බීජ නිෂ්පාදනය සඳහා එම ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුව තිබුණත්, එයට පටහැනිව වාරි ජල පද්ධතිය වැඩිදියුණු කිරීම, දැල් වැටක් සකස් කිරීම, කාර්යාලය ටයිල් ඇතිරීම හා දැල් ගෘහ සෑදීම වැනි ක්‍රියාකාරකම් වෙනුවෙන් උපයෝජනයන් කර තිබුණි.

(ජ) අගුණකොළපැලැස්ස මාෂ භෝග හා තෙල් පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට පර්යේෂණ නිලධාරීන් 11 දෙනෙකු අනුයුක්තව සිටියද, පසුගිය වර්ෂ 08 ක කාලය තුළ භෝග වර්ග 03 කට අදාළ බීජ ප්‍රභේද 06 ක් පමණක් නිදහස් කර තිබුණි. එම ප්‍රභේදයන්ගෙන් 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ ප්‍රභේද 02 කින් පිළිවෙලින් කි.ග්‍රෑ. 2 ක් හා කි.ග්‍රෑ. 459 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍රයට නිකුත් කර තිබුණි. එය ජාතික බීජ අවශ්‍යතාවයෙන් සියයට 0.0003 ක් හා සියයට 0.09 ක් වී තිබුණි.

(ඣ) ලූනු, බඩඉරිඟු හා මිරිස් යන භෝග කාණ්ඩයන්හි නව ප්‍රභේද ඇති කිරීම හා බීජ නිපදවීම වෙනුවෙන් සාර්ථක ලෙස පර්යේෂණ සිදු කිරීමේ අරමුණින්, 2013 වර්ෂයේදී ව්‍යාපෘතියක් ආරම්භ කර ඒ සඳහා රු.මිලියන 50 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. 2017 වර්ෂය අවසන් වන විට ඒ

සඳහා එකතුව රු.මිලියන 46 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ඉකුත් වර්ෂවල ලූනු, බඩඉරිඟු හා මිරිස් යන භෝග සම්බන්ධයෙන් සිදුකළ ක්‍රියාකාරකම් 10 කින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත මූලික අරමුණ හා සම්බන්ධව ක්‍රියාකාරකම් 02 ක් පමණක් ඉටු කර තිබුණි.

(ත) 2017 වර්ෂයේ බාහිර ආයතන හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ රසායනාගාර මගින් එළවළු හා පලතුරු වර්ගවලට අදාළව සාම්පල් 483 ක් පරීක්ෂා කර තිබුණි. එම සාම්පල්වලින් සාම්පල් 294 ක නියමිත පළිබෝධනාශක අවශේෂ සීමාවන් ඉක්මවා තිබුණි. ඒ අනුව පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ප්‍රධානතම කාර්යයක් වන පළිබෝධනාශක භාවිතය නියාමනය කිරීම ප්‍රශස්ථ අයුරින් සිදු කර නොතිබුණි.

## 2.2 විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේදී පලතුරු පසු අස්වනු ව්‍යාපෘතිය යටතේ ඇ.එ.ජ. ඩොලර් 644,693 ක් වැය කර පලතුරු පිරිසැකසුම් මධ්‍යස්ථාන ඉදිකර තිබුණි. එම මධ්‍යස්ථාන ඉදිකිරීමේදී මූලික සමීක්ෂණ හා විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. මේ නිසා ඉදිකළ එම පලතුරු පිරිසැකසුම් මධ්‍යස්ථාන 2018 මැයි 10 දින වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(ආ) Anyigonon Leplopus නැමති වල් පැළෑටිය උපයෝගී කර ගෙන ජෛව පොහොරක් නිපදවීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.427,500 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. එම ව්‍යාපෘතිය ආරම්භක අදියරේ දීම අතහැර තිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු

---------------------------------

### 2.3.1 අඟුණකොළපැලැස්ස කෘෂිකර්ම විද්‍යාලය සඳහා ශ්‍රවණාගාරය ඉදිකිරීම

---------------------------------------------------------------------- --

යථෝක්ත ඉදිකිරීම සඳහා රු.මිලියන 11.21 ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව රු.මිලියන 10 කට වැඩි රු.මිලියන 100 කට අඩු ප්‍රසම්පාදනයන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ඉටු කළ යුතු වුවත්, මෙම ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතේ සිදු නොකර, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් ඉටු කර තිබුණි.

(ආ) මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු තෙවන බිල්පත වෙනුවෙන් 2018 ජනවාරි 29 දින රු.977,040 ක් ගෙවා තිබුණි. එම බිල්පතේ 4.3mm සිට 0.47mm ඝනකමින් යුත් සෙවිලි තහඩු සැපයීම හා සවිකිරීමේ කාර්ය ඉටු කර නොතිබුණු අතර ඒ සඳහා රු.849,600 ක් මුදල් රෙගුලාසි 137, 138 හා 139 විධිවිධානවලට පටහැනිව ගෙවා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු බිල්පත අනුව වැඩ විෂය අංක 5 යටතේ බිම කොන්ක්‍රීට් කර සැකැසීම සඳහා රු.480,410 ක් ගෙවා තිබුණත්, 2018 මැයි 20 දින වන විටත් එම කාර්ය ඉටු නොකර මුදල් රෙගුලාසි 137 හා 138 සඳහන් විධිවිධානවලට පටහැනිව ගෙවීම් කර තිබුණි.

(ඇ) මෙම ඉදිකිරීම සඳහා ප්‍රමිතියෙන් තොර වැලි භාවිතා කර තිබුණි.

**2.3.2 කුණ්ඩසාලේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම**

ඉහත සඳහන් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2016 දෙසැම්බර් මාසයේදී සිමෙන්ති මිටි 135 ක් සඳහා රු.126,225 ක් ගෙවා තිබුණි. එම සිමෙන්ති මිටි විගණන දිනය වූ 2017 ජූලි 21 දින වන විටත් ගබඩාවට ලැබී තිබුණු බව තහවුරු කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පිහිටුවා තිබුණු ගැමා රේඩියේෂන් ඒකකය විසින් ජාන විකෘති කිරීම තුළින් නව ප්‍රභේදයන් (Creation Genetic Variation) නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කර තිබුණි. ඒ සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ එකතුව රු.මිලියන 15.05 ක් වැය කර තිබුණි. 2017 ඔක්තෝබර් මාසය වන විටත් එම ඒකකය විසින් අදාළ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) NVQ 3 හා 4 මට්ටමේ පුහුණු පාඨමාලාවන් පවත්වාගෙන යාම සඳහා 2016 වර්ෂයේදී සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ ගොඩනැගිල්ල රු.මිලියන 6.50 ක් වැය කර ඉදිකර තිබුණි. එම ගොඩනැඟිල්ල ඉදිකිරීමෙන් පසු NVQ 3 මට්ටමේ එක් පුහුණු පාඨමාලාවක් පමණක් පවත්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදි කිසිදු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

(iii) බීජ අර්තාපල් නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පටක රෝපණ අංශය සඳහා 2016 වර්ෂයේදී රු.973,100 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණි. 2017 දෙසැම්බර් මාසය වන විටත් එම උපකරණ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

(iv) ගිරාදුරුකෝට්ටේ හා අරලගංවිල කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන සතු හෙක්ටයාර 29 ක කුඹුරු ඉඩම් පර්යේෂණ කටයුතු සඳහා හෝ වගා කටයුතුවලට හෝ යොදා නොගෙන බදු දී තිබුණි.

**(ආ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු ඉඩම් හෙක්ටයාර් 2,864.65 කින්, ඉඩම් කොටස් 18 ක අයිතිය පමණක් පවරා ගෙන තිබුණි. එය මුළු ඉඩම්වලින් සියයට 23 ක ප්‍රමාණයක් වී තිබුණි.

**(ඈ) පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය**

ප්‍රාදේශීය කාර්යාලවලට අයත් අපහරණය කළයුතු යැයි හඳුනාගෙන තිබුණු වාහන 97 ක් 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර අපහරණය නොකර කාර්යාල පරිශ්‍රවල ගාල් කර තිබුණි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ඉඩම් (හෙක්ටයාර) | 0.56 | වර්ෂ 3කට වැඩි |
| (ii) | ගොඩනැගිලි | 12 | වර්ෂ 3කට වැඩි |
| (iii) | ගොඩනැගිලි | 1 | වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු |
| (iv) | මෝටර් වාහන | 97 | වර්ෂ 3 කට වැඩි |
| (v) | යන්ත්‍ර සූත්‍ර | 108 | වර්ෂ 3 කට වැඩි |
| (vi) | වෙනත් වත්කම් | 71 | වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු |
| (vii) | වෙනත් වත්කම් | 4,410 | වර්ෂ 3 කට වැඩි |

**(ඉ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් ලබා දී තිබුණු ආයතනය | වටිනාකම<br>රු. | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| (i) | ඉඩම් හෙක්ටයාර (10) | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 247,692 | වර්ෂ 11 |
| (ii) | වෙනත් වත්කම් | පොලිස් ස්ථානය මිද්දේණිය | 3,975 | වර්ෂ 21 |

**(ඊ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරහණය කිරීම**

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අක්කර 0.75 ක් විධිමත් අනුමැතියකින් තොරව වර්ෂ 18 ක පමණ කාලයක සිට දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණි.

## 2.5 බැදීම් හා බැරකම්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **වාර්ෂික අයවැය සීමාව ඉක්මවා බැදීම්වලට එළඹීම**

-------------------------------------------------------

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට පටහැනිව වැය විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 274ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 25.4 කින් ඉක්මවා බැදීම් ඇතිකර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂයේ අවස්ථා 57 කදී එකතුව රු.මිලියන 24.84 ක් ගෙවා තිබුණත්, එම ගෙවීම් සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

## 2.6 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව සතු යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළවල් මඟින් වාහන වාර සේවා සිදු නොකර බාහිර ආයතන වෙතින් ඉටු කර ගෙන තිබුණි. මේ නිසා ප්‍රධාන කාර්යාලය සහ ඒ අවට ඇති අංශ සතු වාහන 350 ක් වෙනුවෙන් වාර්ෂිකව රු.මිලියන 8 ක් පමණ ගෙවීමක් බාහිර ආයතනවලට ගෙවීමට සිදුවන බව දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය විසින් ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) රහංගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයේ අක්කර 02 ක පමණ භූමියක විසිරී පැවැති පැඟිරි භෝගවලට (දොඩම්, නාරං) පිටිපුස් රෝගය වැළඳී තිබුණි. එම රෝගය පාලනය කිරීම සඳහා අඛණ්ඩව දිලීර නාශක භාවිතා කර තිබුණි. එම තත්ත්වයන්ගෙන් අත්මිදීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ පර්යේෂණ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) රහංගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථාන භූමිය තුළ ව්‍යාප්තව පවතින ලෝකයේ මිල අධිකම නට් (Nut) වර්ගයක් වන මැකඩමියා කළාපයට විශේෂිත වූ භෝගයකි. එම වගාව කෙරෙහි ගොවින්ගේ අවධානය වැඩි කිරීම තුළින් ප්‍රදේශයේ ගොවි ජීවිතය ශක්තිමත් කිරීමට ක්‍රියා කළ හැකි වුවත්, ඒ පිළිබඳ පර්යේෂණ කර පැළ නිෂ්පාදනය වැඩි කිරීම හා භාවිතය වර්ධනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) 2017 සැප්තැම්බර් 30 දින වන විට 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත සම්මත කර වර්ෂ 37 කට ආසන්න කාලයක් ගතවී තිබුණි. එම පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරනු ලබන සක්‍රීය පළිබෝධනාශක 107 කින් 47 ක පෙර අස්වනු කාලය හා උපරිම අවශේෂ ප්‍රමාණය පිළිබඳ සීමා නිර්ණයන් පනවා නොතිබුණි.

## 2.7 මහජනයා වෙත සේවා ඉටු කිරීම

-----------------------------------

2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ පනතේ විධිවිධාන ප්‍රකාර දෙපාර්තමේන්තුව තොරතුරු පනතේ සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා නිලධාරීන් 16 දෙනෙකු නම්කර තිබුණි. එසේ නම් කළ නිලධාරීන් විසින් ඉටු කළ කාර්යයන්ගේ සමස්ථ අධීක්ෂණය, කාර්යසාධනය මැනීම හා පාලනය සඳහා ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. තවද අතීත

තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් සීමාවන් නොපැවතීම මත ගැටළු පැන නැගුණු අවස්ථා පැවති අතර, සමහර අවස්ථාවල පනතේ සඳහන් කාල සීමාවන් තුළ තොරතුරු සපයා නොතිබුණි.

## 2.8 තිරසාර සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීම

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය සහ ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනතට අනුගතවීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණි. එහෙත් එහි අරමුණු හා ඉලක්ක හඳුනාගැනීම, සියලු අංශවල සහභාගිත්වය, ක්‍රියාකාරකම් ඉලක්ක සමඟ පෙළගැස්වීම, දැනුම හුවමාරු කර ගැනීම හා භාවිතය, ක්‍රියාකාරකම් සඳහා වගවීම පෙළගැස්වීම සහ යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම යන ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළ සතුටුදායක අයුරින් පවත්වා නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 5 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම | දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 2,267.70 | 2,266.18 | 1.52 | 0.06 |
| | මූලධන | 1,532.56 | 1,143.48 | 389.08 | 25.39 |
| | **එකතුව** | **3,800.26** | **3,409.66** | **390.60** | **10.27** |
| 2014 | පුනරාවර්තන | 2,757.71 | 2,751.83 | 5.88 | 0.21 |
| | මූලධන | 1,516.95 | 1,428.07 | 88.88 | 5.85 |
| | **එකතුව** | **4,274.66** | **4,179.90** | **94.76** | **2.21** |
| 2015 | පුනරාවර්තන | 4,057.90 | 3,978.91 | 78.99 | 1.95 |
| | මූලධන | 2,080.35 | 1,806.80 | 273.55 | 13.15 |
| | **එකතුව** | **6,138.25** | **5,785.71** | **352.55** | **5.74** |
| 2016 | පුනරාවර්තන | 4,299.26 | 4,184.22 | 115.03 | 2.68 |
| | මූලධන | 1,541.00 | 1,365.31 | 175.69 | 11.40 |
| | **එකතුව** | **5,840.26** | **5,549.53** | **290.72** | **4.98** |
| 2017 | පුනරාවර්තන | 4,572.61 | 4,249.66 | 322.95 | 7.06 |
| | මූලධන | 1,790.09 | 1,428.08 | 362.01 | 20.22 |
| | **එකතුව** | **6,362.70** | **5,677.74** | **684.96** | **10.76** |

සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය හා උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම.**

**-----------------------------**

වැය විෂයයන් 61 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.10 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**----------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා අංක 20.03.02.18 දරන ආදායම් සංකේත සඳහා රු.මිලියන 280 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 290.7 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 103.8 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන 1996 අංක 24 දරන පස සංරක්ෂණ (සංශෝධන) පනත සහ 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත බලාත්මක තත්ත්වයෙන් සඵලදායීව අපේක්ෂිත පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක නොකිරීම නිසා රජයට ලබා ගත හැකිව තිබුණු ඇතැම් ගාස්තු හා දණ්ඩන ආදායම් අහිමි වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් රැස්කරනු ලබන විවිධ ගාස්තු ප්‍රමාණයන් වර්ෂ 6 ක සිට වර්ෂ 20 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව එම ගාස්තු ප්‍රමාණයන් වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කර නොතිබුණි.

**2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**-----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 300.00 | 299.56 | 180.00 | 188.02 | 1,000.00 | 588.00 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම.**

**------------------------------------------**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව, 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 4.21 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**2.12 වාණිජ අත්තිකාරම් ගිණුම**

**-----------------------------**

දෙපාර්තමේන්තුව විසින් විෂය අංක 28502 දරන කෘෂිකාර්මික ගොවිපළ නඩත්තුව හා බීජ අලෙවිය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්ත සිදුකර තිබුණි. එම අත්තිකාරම් කාර්ය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව එහි මූල්‍ය ප්‍රතිඵලය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල 2017 | | මූල්‍ය ප්‍රතිඵල 2016 | |
|---|---|---|---|---|
| | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය | 190.91 | 159.38 | 104.44 | 61.67 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ අයවිම් හිඟහිටව තිබුණු ශේෂවල එකතුව රු.මිලියන 43.29 ක් වී තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.13 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම්**

**-----------------------------------------------------------------------------**

අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 05 ක ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණි. එම ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු 1991 දෙසැම්බර් 23 දින සිට 2004 ජනවාරි 01 දින දක්වා කාල පරාසය තුළ අවසන් කළ යුතුව තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 13 ක සිට වර්ෂ 26 දක්වා වූ පරාසයක කාල පමාවක් සිදු වී

තිබුණත්, එම ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු නිම කර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා වූ අත්තිකාරම් ගිණුම් 4 කට අදාළව අනුමත නොකළ සමුච්චිත කාරක පාඩු එකතුව රු. මිලියන 65.84 ක් වී තිබුණත්, එම කාරක පාඩු කපා හැරීමට විධිමත් පරිදි කටයුතු කර අවසන් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) එකී ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා වූ අත්තිකාරම් ගිණුමක් අවසන් කළ යුතු කාලය වර්ෂ 26 කින් ඉක්මවා තිබුණි. එම අත්තිකාරම් ගිණුමේ එකතුව රු.මිලියන 1.30 ක අයවිය යුතු ශේෂ හා එකතුව රු.76,157 ක් වූ පියවිය යුතු ශේෂ පැවතුණි. එම ශේෂ 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ පියවා ගැනීමට හෝ දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.14 තත් කාර්ය අතුරු අග්‍රිම ගිණුම නිකුත් කිරීම

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 26 කදී නිකුත් කළ එකතුව රු.මිලියන 1.5 ක තත් කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වි මාස 3 ක සිට මාස 11 ක් දක්වා පරාසයක කාල ප්‍රමාදයකින් පසුව අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණි.

## 2.15 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 6 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 161.5 ක් වී තිබුණි. එම ශේෂ තුළ වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 3ක් වූ තැන්පතු 81 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.16 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) හි 11 වැනි පරිශිෂ්ටය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත්කාලීන කර නොතිබුණි |
| (iv) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | යාවත්කාලීන කර නොතිබුණි |
| (v) | වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | යාවත්කාලීන කර නොතිබුණි |
| (vi) | පර්යේෂණ පිළිබඳ ලේඛනය | 2010 සැප්තැම්බර් 23 දිනැති අංක 08/2010 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 4 ඡේදය | පිළියෙල කර නොතිබුණි. |
| (vii) | පැළ නිෂ්පාදන ලේඛනය | 2010 සැප්තැම්බර් 23 දිනැති අංක 08/2010 දරන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | විධිමත්ව පිළියෙල කර නොතිබුණි. |
| (viii) | ඉන්ධන පාරිභෝජන ලේඛනය | 2017 ඔක්තෝබර් 13 දිනැති අංක අවිග/03/12/2017/02 දරන කෘෂිකර්ම දෙපාර්තමේන්තු යාන්ත්‍රික සටහන් පොත් භාවිතය පිළිබඳ මඟපෙන්වීම | යාවත්කාලීන කර නොතිබුණි |

## 2.17 අනුකූල නොවීම

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| (i) | 1996 අංක 24 දරන පස සංරක්ෂණ (සංශෝධන) පනතේ 3.1(ඇ) වගන්තිය | පනත සම්මත කර වර්ෂ 20 ක් ගතවී තිබුණද, පස සංරක්ෂණ අරමුදලක් පිහිටුවා නොතිබුණි. |
| (ii) | 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත | පනත සම්මත කර වර්ෂ 18 කට අධික කාලයක් ගතවී තිබුණද, පනතේ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය රෙගුලාසි සකස් කර නොතිබුණි. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 504(1) (අ), (ආ), (ඇ) හා (ඈ) | එක් එක් කාර්තුව අවසානයේදී වෙළඳ ණයගැතියන්, වෙළඳ ණයහිමියන්, අමුද්‍රව්‍යය, ගබඩා භාණ්ඩ, සැපයුම් හා නිමි භාණ්ඩ පිළිබඳ ප්‍රකාශ පිළියෙල කර, එම කාර්තුවට පසුව එළඹෙන ප්‍රථම මාසයේ 15 වැනි දිනට මත්තෙන් විගණකාධිපතිට පිටපතක් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 505 | සෑම මාසයකටම වරක් තොග හා බඩුබාහිරාදිය විෂයයන් කිහිපයක ඒවායෙහි තොග ලෙජර ශේෂයන් සමග සම්පූර්ණ භෞතික සත්‍යාපන පිරික්සුමකට භාජනය කර එහි ප්‍රතිඵලද යම් විෂමතාවයක් ඇතොත් ඒ සම්බන්ධව අදාළ මුදල් රෙගුලාසිය යටතේ කටයුතු කර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**2.18 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය යටතේ රු.මිලියන 2,730.6 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.272,134 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 985 | 446 | 539 |
| (ii) | තෘතීයික මට්ටම | 208 | 81 | 127 |
| (iii) | ද්විතීයික මට්ටම | 3,757 | 2,771 | 986 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6,132 | 5,391 | 741 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | 1,505 | 1,345 | 160 |
| | **එකතුව** | **12,587** | **10,034** | **2,553** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ඇතැම් අංශවල අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නිලධාරීන් හා සේවකයන් සේවයේ යොදවා තිබීම මත ඇතැම් අංශවල විශාල වශයෙන් පුරප්පාඩු ඇතිවීම හේතුවෙන් විශේෂිත රාජකාරි වෙනුවෙන් බඳවාගත් කම්කරුවන් එම පුරප්පාඩු පවතින අංශවල වෙනත් රාජකාරි ආවරණය සඳහා යොදවා තිබුණි.

(ආ) 2016 වර්ෂයේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරු 05 දෙනෙකු පුහුණු වැඩසටහන් වෙනුවෙන් අනුයුක්ත කර තිබූ අතර, සමස්ථයක් ලෙස ගත් කළ එක් නිලධාරියෙකු විසින් වාර්ෂික පුහුණු පැය 39 ක සිට පැය 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් පමණක් පවත්වා තිබුණි.